## කෙටි කතාව



# බූරුවෝ

උපසේන හේවගේ

බූරු ගොවිපලේ රැකියාව මා පැනලා බාර ගත්තේ මෙරටට ආපු විගස පිදුරු ගසක හෝ එල්ලෙන්න සූදානම් වි සිටි බැවිනි. හදිසියේ හඳුනා ගත් තුර්කි මිතුරකුගේ උපකාරයෙන් කිසිදු වග විභාගයක් නොබලා මේ රැකියාව බාර ගත් මම පසුවදාම යුහු යුහුව වැඩ පල බලා නික්මුනෙමි.

නගරයේ සිට නැගෙනහිර අතට විහිදෙන අධිවේගී මාරගය ඔස්සේ පැය භාගයක් පමණ ගමන් කොට එතැනින් වොබටන් තාපසාරාමය කරා දිවෙන මගට වැටුනු විට තුන්වෙනිවට හමුවන බොරලු පාර ඔස්සේ මුඩු නිසරු කඳු ගැට දෙකක් පසු කළ විට අපගේ මහා බූරු ගොවිපල ඔබට හමුවේ. කඳු බෑවුමක් පල්ලේ තිබෙන මේ නිසරු තණ බිම මේ සතූන්ගේ නිරන්තර කෑම මේසය විය.

ගොවිපලේ බූරුවන් හැත්තෑපහක් පමණ විසූ අතර ඔවුන් නහවා පිරිසිදු කොට නිසි වේලාවට තණ කොල වලට අමතරව පෝෂ්‍ය දායක කෑම හා විටමින් වර්ග මෙන්ම අවශ්‍ය බෙහෙත් දිම මා ඇතුලු සේවකයන් ගේ රාජකාරි ලැයිස්තුවේ ප්‍රමුඛ ඒවා විය. රෑ කාලයේ මේ සතුන් රඳවා තබන විශාල ගාලේ එක් කොනක තිබෙන කුටියක තිබෙන විශාල රාක්කයක මේ සතුන්ට දෙනු ලබන ප්‍රතිජීවී ඖෂධ හා විවිධ ෂැම්පු වරග වලින් පිරුණු රාක්කයක් විය. ඊට යාබද වූයේ අපේ කාරයාලයයි.

වැඩ පොලේ හිමිකරු යුදෙව් ජාතිකයෙක් වූ අතර ඔහු නියම මසුරු සිටානන් කෙනෙකු හැටියට සේවකයින් අතර නම් දරා සිටියේය. එහෙත් බූරුවන්ට සැලකීමේදී ඔහු මේ පිලිවෙත අමතක කළේය. සතුන්ගේ නිරෝගී භාවය ගැන ඔහු දැක්වූයේ බෙහෙවින් අසාමාන්‍ය සැලකිල්ලකි. කිසියම් සතකුගේ බර අඩුවිමක් හෝ සමේ රෝගයක් හෝ වාර්තා වුවහොත් යුදෙව්වා බෙහෙවින් කනස්සල්ලටත් කෝපයටත් පත්වෙයි. මේ නිසා එබඳු තත්වයක් ඇති නොවන්නට වග බලා ගැනීම අපේ අංක එකේ රාජකාරිය විය.

මේ ගොවිපල පවත්වාගෙන යන්නේ කුමන හේතුවකටද යන්න දැන ගෙන සිටියේ නම් ඒ කිහිප දෙනෙකු පමණි. නමුත් ඒ නිසා බෙහෙවින් දූෂමාන ගනයේ හේතු අප අතර ඕනෑවටත් වඩා තිබුනි. දුෂ්කර මං මාවත් සහිත ප්‍රදේශ වල බඩු ගෙන යාම සඳහා බූරුවන් යොදා ගැනීම ගැන අපි දැන ගෙන සිටියෙමු. එමෙන්ම ගෝත්‍රික ජනයෝද තම තමන්ගේ බූරුවෝ ඇති දැඩි කර ගත්හ. පළමු හා දෙවන ලෝක යුද්ධ බඩු එහා මෙහා ගෙන යමින් යුද්ධයට දායකත්වයක් දුන්නද වර්තමානයේ බූරුවන් ඒ සඳහා අහලකටවත් වැද්ද නොගනිති.

එහෙත් අප බූරු හිමියා මේ කිසි දෙයකින් නොසැලී තම ගොවිපල පවත්වා ගෙන ගියේය බූරු සමෙන් නිපදවා ගන්නා රසායනයකින් තැනෙන ලිංගික වාජීකරණයකට හොංකොං හා චීනය වැනි රටවල විශාල ඉල්ලුමක් තිබෙන බවක් වටින් ගොඩින් ආරංචි වුවද එය කෙතරම් සත්‍ය දැයි කියන්නට අපි කිසිවෙක් දැන නොසිටියෙමු. ඇත්තටම මසකට දෙවතාවක් පමණ අපේ ගොවිපලේ බූරුවන් දෙතුන් දෙනෙකු සතුන් ගෙනයන වාහනයක නැගී කොහෙදෝ ගියහ. උන් එකෙක් වත් ආපසු ආවේ නම් නැත .

මාස කිහිපයක් ගතවත්ම මම කෙමෙන් මේ රැකියාවට හුරු වුනෙමි. එක එක සතා ගේ විවිධ හැසිරීම් රටාවන් හඳුනා ගෙන ඒ අනුව ක්‍රියා කිරීමට හැකිවිම ඊට හේතුවක් වන්නට විය. ගොවි පලේ උදවි සඳහා විවිධ රටවලින් සංක්‍රමණිකයින් කිහිප දෙනෙකුම මෙහි වරින් වර ආහ. ඔව්හු මට මතක හැටියට කොරියාව සරබියාවල පෝලන්තය වැනි යුරෝපා රටවල් හෝ විවිධ අප්‍රිකානු රටවලට අයත් අය වූහ. ශ්‍රී ලාංකිකයින් දෙතුන් දෙනෙකු ද මේ අය අතර වූහ. මේ ලෙස ආ කවුරුත් පාහේ හොඳට අං ගිලපු එවුන් වූහ.

එහෙත් පොදුවේ අප කාටත් මේ අහිංසක බූරුවන්ගෙන් උගත යුතු පාඩම් රාශියක් තිබුනි. ප්‍රධානම කාරණාව වූයේ කිසි දෙයකට ඕනෑවට වඩා කා කොටා නොගැනීමයි. තණ කොල මිටකට එකම පෙම්වතියකට පොඩ්ඩක් කෑ කෝ ගසා ගැනීමක් හැරෙන්නට මේ සතුන් බෙහෙවින් සාමකාමිව ජීවත් වූහ. තරහාමරහා හිතේ තබා ගෙන සිටීම ගොදුරු තණ පලාසේ තමන් සතු කොටස ඩැහැ ගෙනම කිසිවෙකු සමග බෙදා හදා ගැනිමට නොතිබෙන සූදානම මොවුන් අතින් දිස් වූයේ නැත. කණ්ඩායමක හැසිරීම මූලික අවශ්‍යතා සපිරිනු පසු අනවශ්‍ය ප්‍රශ්න පසු පස නොයාම දිය යටින් ගින්දර ගෙන නොයාම හා උඩ බලා ගෙන කෙල නොගැසීම ද මේ සතුන් මෙහි පැමිනි බොහෝ දෙනෙකුට උගත යුතු පාඩම් අතර විය.

මිනිසුන් මෙන්ම සතුන් ද ආදරය ගෞරවය ප්‍රිය කරති. සුහදව ඇමතීමෙන් සුමුදු ලෙස ස්පරශ කිරීමෙන් කැත්තකින් පොල්ලකින් කර ගන්නවාට වඩා හොඳ සත්ව පාලනයක් ගෙන යා හැකි බව මා උගෙන ගත්තේ මේ සතුන් ගෙනි. මට නොදැනුවත්වම පාහේ මේ ආකාරයට මේ බූරුවන් හා සමාජ ගනුවෙනුවකට නියැලෙන්නට සිදුවිය. එහෙත් ව්‍යාපාරයක් වශයෙන් මෙබඳු ගොවිපලක් පවත්වාගෙන යාමේ ප්‍රායෝගිකත්වය ගැන අප තුල ප්‍රශ්න දිගින් දිගටම ඉතිරිව තිබුණේය.

"හොඳයි.. මාසයකට බූරුවන් දෙතුන් දෙනෙකු විකුනා අපේ පඩිනඩි ගෙවා මෙය දිගින් දිගටම පවත්වා ගෙන යන්නට පුථවන්ද?"

"ඔන්න තියෙන වැඩක් පලක් තරල දෙන තුට්ටු දෙයක් අරන් හිටපං.. මං දන්නෙත් නැහැ ඕක ගැන.. මට දැන ගන්න ඕනි කමකුත් නැහැ" මේ කාරණාය ගැන මං ඉඳහිට ප්‍රශ්න කරන විට මට කිට්ටුම සගයා නිතරම දුන්නේ මෙබඳු පිළිතුරකි.

ඒකාකාරී වැඩ මාලාවත් ඒවායේ දී මුහුන පාන විවිධ ගැටලු නිසාත් මගේ කුතුහලය මඳ කලකට යටපත් කර ගෙන සිටීමට සිදුවිය. මගේ සගයා කියන්නාක් මෙන් අපි නිසි පරිදි පඩි ලැබෙන්නේ නං අයිති කාරයා බූරුවන් ඇති කරන්නේ කිරි ගන්න වුනත් මට මොකද? අද කාලයේ හැටියට තමන්ගේ වැඩක් බලා ගෙන වැඩ කරන පැය අටේ ගැටඹ විඳ දරා ගෙන ගෙදර ආ විගස ඒවා අමතක කර දැමීමට මම ද අමාරුවෙන් හුරු වන්නට විමි.

මාස කිහිපයක් ගතවත්ම මම කෙමෙන් මේ රැකියාව ට හුරු වුනෙමි. කාලය ගෙවි යද්දී මෙය අපේ වැඩපොල යැයි කියා ගත හැකි තරමට ගොවිපල මට සමීප විය. ගොවිපලේ අයිති කරුවා සමග කලින්ට වඩා කිට්ටු සම්බන්ධයක් ඇති කර ගැනිමටද හැකියාවක් ලැබුනි. අඩු කතා බහකින් යුක්ත වුවද අප බූරු හිමියා මා හිතූවාටත් වඩා මිත්‍රශීලි කෙනෙකැයි මට වරෙක සිතූනි. මම සේවය කරන අතර වලදී ලැබෙන පැමිනිලි චෝදනා අඩු වීම

*"මම මෙහෙ නිල චාරිකාවක් ආපු ගමන්.." ඔහු සිනා සෙමින් කියයි. දන් නැද්ද.... පොඩි විවේකයකටත් එක්ක. ඉතින් උඹට කොහොමද?"*

මෙයට එක හේතුවක් වන්නට ඇතැයි මම කල්පනා කළෙමි. කෙසේ වුවත් මේ සබැඳුම ඔහු ගේ මේ අපූරු ව්‍යාපාරයේ රහස් හෙලි කර ගැනීමට මගක් වේ යැයි මම සිතුවෙමි.

මසකට වරක් පමණ බූරුවන් ගෙන යාමට එන ට්‍රොලිය ඈඳා ගෙන අප අයිති කරුවා සිය සුඛෝපභෝගි ජිප් රථයෙන් මෙවරත් පැමිනියේය. විපතක සේයාවක් හගවමින් බූරුවෝ තම කන් උඩට හරවා ගත්හ. සාමාන්‍යයෙන් ඔහු මෙසේ එන වාර වලදි වෙනමම මුහුණක් හදා ගෙන එයි. අපි ඔහු ඉල්ලන සතූන් පටවා දෙනවා හැරෙන්නට වැඩි කතා බහකට නොයන්නට වග බලා ගතිමු. එහෙත් වාහනය පිටත් වෙන්නට ඔන්න මෙන්න කියා තිබෙන විට ඔහු අතින් මට සන් කළේය.

"යමු අද මගෙත් එක්කම.."

මම කිසිඳු පැකිලිමක් නොමැතිව අනිත් පැත්තෙන් දොර ඇරගෙන රථයට ගොඩ නැගුනෙමි. බලාපොරොත්තු නොවූ අවස්ථාවකදී මේ බූරු ගනුදෙනවුව පිළිබඳ අභිරහස හෙලි කර ගැනීමට හැකිවන සතුට සිත තුල මෝදු වෙමින් පැවතිනි. පසල් දනවි රැසක් පසු කරමින් වාහනය නගරයේ ප්‍රති දිසාවට දෙසට ඇදී ගියේය. මගේ කුතුහලය උපරිම තලය කර පැමිනෙමින් තිබුනි. එහෙත් එක්තරා කඩ වීදියක් ලගදි ගමන බාල විය. ඔහුගේ මුහුනින් කිසියම් දෙගිඩියාවක සලකුණු පහල විය. සාක්කුවට අත යැවු ඔහු රිසිට් පතක් දිගු කළේය.

"අන්න අර කඩේට ගිහිල්ල මේකෙ තියෙන බඩු ටික සූදානම් කරල තියාගෙන ඉන්න.. මම එන කොට ඒවත් අර ගෙන දෙන්නටම ආපහු යන්න පුලුවන්.."

ඉතින් මගේ කුතූහලය තවත් කාලයකට මැඩ පවත්වා ගෙන සිටිමට සිදු විය. මේ කාලය තුලදී මම මේ සතුන් දෙස වඩා විමසිල්ලෙන් බලා සිටීමටත් ඔවුන්ගේ හැගිම් තේරුම් ගැනිමටත් උත්සාහ ගත්තෙමි.

ඇත්තටම තම කණ්ඩායමෙන් කිසිවකු වියෝවිම ඔවුන්ද උපේක්ෂාවෙන් දරා ගත්තේ යැයි මට සිතුන වාර අනන්තය. ඔවුන් අර වාහනය ඈතට ඇදි යන තුරු එනක රලට වි බලා සිටියෝය. ඇත්තටම ශත වර්ෂ ගණනාවක් තුල මිනිසාගෙන තිරිසන් සතුනට සිදුවි තිබෙන අසාධාරණය කෙතරම් දරුණුද? කොටින්ම ඔවුන්ගේ ජිවත් විමේ කාල සීමාව තීරණය කරන්නේ මිනිසාය.

මහා මුරංඩු හිතුවක්කාර සතුන් රැසක් වශයෙන් මිනිසා විසින් නම් කරනු ලැබ තිබුනද තම ස්වාමියාගේ හැගිම් තේරුම් ගැනිමේ පුදුම ඉවක් මේ සතුනටත් තිබුනි. අපගෙන් කිසිවකු හෝ කිසියම් නොරිස්සුම් සහගත බවකින් පෙලුනොත් මොවුන් අපේ ඇගේ ඇතිල්ලිමට වත් උත්සාහ කරන්නේ නැත. කෙතරම් පිරිසිදුව තැබිමට ද උත්සාහ කළද නිතර තෙතමනයට හසුවිම නිසා නික්මෙන හඩු ගඳ නිසා අපි මේ තත්වයට කොහොමටවත් කැමැත්තක් නොදැක්විමු.

මෙසේ කාලය ඉකුත් වත්ම මට මේ සතුන් ගේ විවිධ රුචි අරුචි කම් මෙන්ම ඔවුන් හසුරුවා ගැනීමට යෙදිය යුතු වෙනස් වෙනස් උපාය මාරග හුරු කර ගැනීමට හැකියාව ලැබුනි. කෙටි සරල විධාන වලට හුරු කිරීම ආයාසයෙන් කළ යුත්තක් විය. මේ තත්වය නිසා මට පසු කලෙක ගොවිබිමේ වැඩ මූලික තනතුරක් ලැබුනි. මට නොදැනුවත්වම පාහේ ඒක්කෝ මගේ මනෝ භාවයන් තේරුම් ගැනීමට බූරුවන් සමත්වූවාද එසේ නැතිනම් මේ සතුන්ගේ යම් යම් චරිතාංගයන් මා තුල හොල්මන් කරන්න්නට පටන් ගත්තාද? ඇත්තටම මේ බූරුවන් ඇති කිරීමේ සැබෑ ව්‍යාපාරික අරමුණ කුමක්ද යන්න සොයා ගැනීම අභිබවයමින් මේ ප්‍රශ්නය මා තුල පිලිරුවි දෙන්නට පටන් ගත්තේය.

මෙම පරිසරයෙන් මිදී ඉසිඹුවක් පතා මා නගරයට ගියේ ඉඳහිටය. මම ඒ කාලය වන විට ගොවිපල හරියෙන්ම ඉඩමක් මිලට ගෙන ගෙයක් සාදාගෙන පාඩුවේ ජිවත් විමට හිත හදා ගනිමින් සිටියෙමි. මේ එක් ගිය එක් වතාවක ලංකාවේ සුනාමියෙන් විපතට පත් වූවන්ට ආධාර පතා එක්

ඔබේ ශ්‍රී ලාංකික දන්ත වෛද්‍යවරයා
Dr Shahnaaz Ozeer
B.D.S. , Dip. Clin. Dent (Restorative) NZ
Dip. Clin. Dent (Oral Medicine) NZ
DENTIST
Facilities are also available for :
Mini implants
Whitening of teeth
Aesthetic dentistry
Preventive Care
1254 Plenty Road, Bundoora 3083
Tel : 03 9467 7760
Sannasa